
T.A.A. නයෝමි
ICT ආචාර්ය
කෑ/මහානාග මහා විද්‍යාලය

# දත්ත සමුදාය කළමනාකරණ පද්ධති



# දත්ත සමුදායක් යනු

අවශ්‍ය තොරතුරු පහසුවෙන් උකහාගත හැකි වෙන පරිදි සංවිධානය වී ඇති එකිනෙකට සම්බන්ධ දත්ත එකතුවක් දත්ත සමුදායක් ලෙස හැදින්වේ



# හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායන් වෙනස



අත්යුරු




ඉලෙක්ට්‍රොනික්

# හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායන් වෙනස

| හස්තමය දත්ත සමුදාය | ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය |
|---|---|
| කාර්යක්ෂමතාව අඩු ය | කාර්යක්ෂමතාව වැඩි ය |
| නිරවද්‍යභාවය අඩු ය | නිරවද්‍යභාවය වැඩි ය |
| විශ්වසනීයත්වයඅඩු ය | විශ්වසනීයත්වය වැඩි ය |
| දත්ත විශ්ලේෂණය කිරීමේ හැකියාව අඩු ය | දත්ත විශ්ලේෂණය කිරීමේ හැකියාව වැඩි ය |
| දත්ත ඇතුළත් කිරීමේ අනුක්‍රමය වෙනස්කළ නොහැකි ය | දත්ත ඇතුළත් කිරීමේ අනුක්‍රමය වෙනස් කළ හැකි ය |

# හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායන් වෙනස

| හස්තමය දත්ත සමුදාය | ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය |
|---|---|
| අනවශ්‍ය දත්ත මකාදැමීම අපහසු ය | අනවශ්‍ය දත්ත මකා දැමීම පහසු ය |
| දත්ත යාවත්කාලීන කිරීම අසීරු ය | දත්ත යාවත්කාලීන කිරීම පහසු ය |
| වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ | අඩු ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ |
| මිනිස් ශ්‍රමය වැඩි වශයෙන් අවශ්‍ය වේ | මිනිස් ශ්‍රමය අඩුවෙන් අවශ්‍ය වේ |

# දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංගක් යනු

විශාල ප්‍රමාණයෙන්

- දත්ත රැස්කිරීම
- සංවිධානය කිරීම
- හැසිරවීම
- ගබඩා කිරීම

සඳහා සකස් කරන ලද **තනි මෘදුකාංග පද්ධතියක්** දත්ත සමුදාය කලමනාකරණ පද්ධතියක් ලෙස හැඳින්වේ සමුදාය කලමනාකරණ පද්ධතියක් මගින් පරිශීලකට ඉහත කාර්යය සඳහා විධිමත් ප්‍රවේශයක් සපයයි

# දත්ත සමුදාය කළමනාකරණ පද්ධති

උදාහරණ

- MySQL
- Microsoft Access
- SQL Server
- Oracle

# දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාව

- ඒකාග්‍රතා සම්බාධක බලාත්මක කරයි
- දත්ත උපස්ථ කිරීම සහ ප්‍රතිසාධනය
- ඵලදායි දත්ත විභාජනය
- ආරක්ෂාව ලබා දීම

# DBMS
# සංරචක (වස්තු)

- වගු - ලැයිස්තු ආකාරයෙන් දත්ත ගබඩා කිරීමට
  වගු යොදා ගනී
- විමසුම්- එක් වංගුවකින් හෝ එකිනෙකට සම්බන්ධිත වගු
  කිහිපයකින් අවශ්‍ය පරිදි දත්ත ලබා ගැනීමට උදව් වේ
- පෝරම- දත්ත ඇතුළත් කිරීම් කිරීමට සහ ආපසු ලබා
  ගැනීමට උදව් වේ
- වාර්තා- මුද්‍රණය කළ හැකි පරිදි දත්ත ලබාගැනීමට වාර්තා
  උදව් වේ

# වගු- දත්ත ගබඩා කිරීමට යොදා ගනී

## වගුවක ලක්ෂණ

- වගුවක ඇති තීරුවක් ක්ෂේත්‍රයක් (උපලැකි) ලෙස හඳුන්වයි
- වගුවක ඇති පේලියක් රෙකෝඩයක් (උපලැකියාන) ලෙස හඳුන්වයි

## ප්‍රාථමික යතුර

- මෙය තීරු නාමයක් වන අතර පේලියක් අනන්‍යව හඳුනා ගැනීමට භාවිතා කරයි




## ආගන්තුක යතුර

- වගුවක ප්‍රාථමික යතුර වෙනත් වගුවක යෙදෙන විට ඒය දෙවන වගුවේ ආගන්තුක යතුර වේ

# ක්ෂේත්‍ර ගුණාංග

දත්ත ප්‍රරූප ,ක්ෂේත්‍රයේ ප්‍රමාණය,  ආකෘතිය ආදිය

**දත්ත ප්‍රරූප** - එක් ක්ෂේත්‍රයක ඇතුළත් කළ යුතු දත්තවල ස්වභාවය අනුව එයට දත්ත ප්‍රරූපයක් ලබාදෙයි

උදා - Text/Char/ Varchar,
Number/ Int/Integer/Float/Decimal,
Boolean/Yes No,
Currency/Money
Date Time etc.

# විමසුම්

එක් වගුවකින් හෝ එකිනෙකට සම්බන්ධ වගු කිහිපයකින් හෝ අවශ්‍ය පරිදි දත්ත ලබාගැනීමට විමසුම් යොදාගැනේ

# පෝරම

දන්ත ඇතුලත් කිරීමට සහ බලාගැනීමට පෝරම යොදාගැනේ. වගුවක වගු කිහිපයක, විමසුම්කින් හෝ විමසුම් කීපයකින් එක් පෝරමයක් සැදිය හැකිය.

# වාර්තා

මුද්‍රණය කළ හැකි පරිදි දත්ත ලබා ගැනීමට වාර්තා යොදාගැනේ වගුවක, වගු කිහිපයක, විමසුමකින් හෝ විමසුම් කීපයකින් හෝ එක් වගුවක් සැදිය හැකිය. වාර්තා මායාකරු මේ සඳහා පහසු ක්‍රමයක් සපයයි.